**2012**



# ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

# වාර්ෂික වාර්තාව

නො. 223 සී, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 5
දු.ක.: 011-2807945, 2808947, 2807346
ෆැක්ස්: 011-2807347, විද්‍යුත් තැපෑල: nastecsl@yahoo.com,
වෙබ් අඩවිය: www.nastec.lk

NASTEC

# ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

# වාර්ෂික වාර්තාව 2012

නො. 223 සී, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 5
දු.ක.: 011-2807945, 2808947, 2807346
ෆැක්ස්: 011-2807347, විද්‍යුත් තැපෑල: nastecsl@yahoo.com,
වෙබ් අඩවිය: www.nastec.lk

# අප ගැන

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (නස්ටෙක්) 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ පනත මගින් ස්ථාපිත කළ ආයතනයක් වන අතර 1998 අගෝස්තු මාසයේදී එය ක්‍රියාත්මක වීම ඇරඹිණ. 1998 දෙසැම්බර් 06 දින නිල වශයෙන් ආරම්භ කළ අතර ක්‍රියාකාරී ආයතනයක් බවට පත්වූයේ 1999 ජනවාරි මස සිටය. ශ්‍රී ලංකා රජයට විද්‍යා හා තාක්ෂණ කරුණු සම්බන්ධව උපදෙස් ලබාදීම හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වූ ඉහළම ආයතනය වශයෙන් නස්ටෙක් ආයතනය නම් කරන ලදී. කොමිෂම සාමාජිකයන් සත් දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් පත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමන් විසිනි.

# පටුන


අපගේ දැක්ම සහ මෙහෙවර ........................................................................ 06

අධ්‍යක්ෂතුමාගේ ප්‍රකාශය ........................................................................ 07

කොමිෂන් සභා සාමාජිකයින් ........................................................................ 08

ආයතනික ආකෘතිය ........................................................................ 10

ආයතනික ව්‍යුහය ........................................................................ 11

විද්‍යා හා තාක්ෂණ සමාලෝචනය ........................................................................ 12

*රටේ විද්‍යා හා තාක්ෂණ තත්ත්වය පිළිබඳ වාර්ෂික සමාලෝචනය ......... 12*

*විද්‍යා හා තාක්ෂණ ආයතන සමාලෝචනය ........................................ 12*

ජාත්‍යන්තර සබඳතා ........................................................................ 14

*නාම් මධ්‍යස්ථානය විසින් ලබාදෙනු ලැබූ පුහුණු අවස්ථා...................... 14*

අනෙකුත් නස්ටෙක් ක්‍රියාකාරකම් ........................................................................ 15

*තරුණ විද්‍යාඥ සංසදය ........................................................................ 15*

අපගේ කාර්යය මණ්ඩලය ........................................................................ 21

කාර්යය මණ්ඩල පුවත් ........................................................................ 22

*සේවක මණ්ඩලය සහභාගී වූ වැඩසටහන් ............... .......................... 23*

කෘතඥතාව ........................................................................ 24

මූල්‍ය ප්‍රකාශනය ........................................................................ 25

විගණකාධිපති වාර්තාව ........................................................................ 27

## වාර්ෂික වාර්තාව 2013

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ ප්‍රකාශනයකි.

**සංස්කරණය : ආචාර්ය මුදිත ලියනගෙදර**

**පරිවර්තනය : නිල්මිණී පෙරේරා**
**සයුමි විජේසිංහ**
**නිශාන්ති මහරගේ**

**මැයි 2012**

## අපගේ දැක්ම

**“ශ්‍රී ලාංකීය ජනතාවගේ සමෘද්ධිය හා සෞභාග්‍යය ඉහල නැංවීම උදෙසා විද්‍යාවේ හා තාක්ෂණයේ විභවය හා භාවිතය පිළිබඳ රජයට උපදෙස් සපයන විශිෂ්ඨ ආයතනයක් වීම”**

## අපගේ මෙහෙවර

**“තිරසාර සංවර්ධනය සඳහා යොදා ගැනීම උදෙසා විද්‍යා හා තාක්ෂණ ජාතික හැකියාවන් ගොඩනැංවීම සඳහා රජයට ප්‍රතිපත්ති, උපායමාර්ග සහ සැලසුම් ඉදිරිපත්කිරීම ”**

# අධ්‍යක්ෂතුමාගේ ප්‍රකාශය



2012 වර්ෂය ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසමට අභියෝගාත්මක වර්ෂයක් විය. සභාපතිවරයාද ඇතුළු කොමිෂන් සහා සමාජිකයින්ගේ නිල කාලය 2012 ජනවාරි මාසයේදී අවසන් විය. අධ්‍යක්ෂක තනතුර වසර පුරාම පුරප්පාඩුව පැවතිනි. අත්දැකීම් සහිත වැඩසටහන් සහායකයින් දෙදෙනාගෙන් එක් අයෙකු 2012 අගෝස්තු මාසයේදී ආයතනයෙන් ඉවත් විය. එම නිසා කොමිසමට එහි විධිනියෝගයන් සම්පූර්ණ කිරීමේදී එහි ප්‍රමාණවත් නොවන මානව සම්පත් සමඟ බලවත් පරිශ්‍රමයක් දැරීමට සිදු විය.

එහි ප්‍රපිපලයක් ලෙස කොමිසම විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තීන් හා සැලසුම් සම්පාදනය කිරීමේ විධිනියෝගය පසෙකලා එහි ක්‍රියාකාරකම් විද්‍යා හා තාක්ෂණ සමාලෝචනයට (ආයතන හා රටේ තත්ත්වය) සීමා කරන ලදී. කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා නවීන තාක්ෂණය සඳහා වූ ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය මෙම වසර තුළ සමාලෝචනය කරන ලද ආයතන දෙක වේ. මෙම වසර තුළදී සමාලෝචනය කිරීම සඳහා සැලසුම් කරන ලද අනෙක් ආයතන දෙක ස්වයං ඇගයීම් වාර්තා ලබා දීමේදී සිදු වූ ප්‍රමාදය හේතු කොට ගෙන ඔවුන්ගේ සමාලෝචනයන් 2013 වසරට කල් දැමීමට සිදු විය.

සේවක සංඛ්‍යාව සීමිත වුවත් තරුණ විද්‍යාඥ සංසදයේ ක්‍රියාකාරකම් සැලසුම් කල අයුරින් සම්පූර්ණ කරන ලදී. තරුණ විද්‍යාඥයින් සඳහා කුසලතා සංවර්ධන වැඩමුළු 2ක් ද, උතුරු මැද පළාත් උසස් පෙළ විද්‍යා අංශයේ ගුරුවරුන් සඳහා පුහුණු වැඩමුළුවක් හා තරුණ විද්‍යාඥයින් සඳහා පර්යේෂණ සම්මන්ත්‍රණයක්ද ඒ අතර විය.

කොමිසම සුපුරුදු පරිදි විද්‍යාඥයින් හා අනෙකුත් නිලධාරීන් සඳහා ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා සහභාගී වීමට නාම් ආයතනය හරහා නොමිලේ අවස්ථාව සලසා දෙන ලදී. එමෙන්ම කොමිසම සේවකයින් සඳහාද පුහුණු වීම් ලබා දෙන ලදී.

මා විසින් පෙර වසරේදී ද මගේ ප්‍රකාශයේ සඳහන් කළ පරිදි, සේවක හි- ය වැඩබලන අධ්‍යක්ෂවරයා ඇතුළු ජ්‍යෙෂ්ඨ කාර්යය මණ්ඩලය ඔවුන්ගේ ප්‍රධාන කාර්යන්ගෙන් අපගමනය කොට බිම් මට්ටමේ මෙහෙයවීම සඳහා යොමු කර ඇත. බලධාරීන් එහි පිරිවැය හොඳින් දන්නා නමුදු එය තවමත් වටහා ගෙන නොමැත.

අවසාන වශයෙන්, කැපවී වැඩ කළ කාර්යමණ්ඩල සාමාජිකයන්ට මා ණයගැති වන බව ප්‍රකාශ කළ යුතු අතර ඔවුන්ගේ හෘදයාංගම සහයෝගය නොතිබුණි නම් නස්ටෙක් ආයතනය එහි අභිමථාර්ත කරා රැගෙන යාමට මා හට නොහැකි වනු ඇත.

ආචාර්ය මුදිත ලියනගෙදර
**වැඩබලන අධ්‍යක්ෂ**

# කොමිෂන් සභා සාමාජිකයින් (2012 ජනවාරි මස 09 දින දක්වා)

**මහාචාර්ය නාලිනී බී. රත්නසිරි**
**සභාපතිනිය**



කීට විද්‍යාඥ: සත්ව විද්‍යාව පිළිබඳ සම්මානිත මහාචාර්ය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය; කීට විද්‍යා පර්යේෂණ නිළධාරිනී, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (1966-1974); කීට විද්‍යා පර්යේෂණ නිළධාරිනී, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව (1974-1983); සත්ව විද්‍යාව පිලිබඳ මහාචාර්ය (1983-1986); ප්‍රාරම්භක පීඨාධිපති, ස්වභාවික විද්‍යා පීඨය (1986-1992) සහ සත්ව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (1986-2005), ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය; සාමාජික සහ උප සභාපතිනි, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (1993-1994); සභාපතිනි, ජාතික මෙහෙයුම් කමිටුව, GEF/UNDP සුළු ආධාර වැඩසටහන්; සාමාජික, ජාතික මෙහෙයුම් කමිටුව, EU/UNDP නිවර්තන කලාපීය වනාන්තර ප්‍රවර්ධන වැඩසටහන; සාමාජික, විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිලිබඳ නිත්‍ය කමිටුව, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව; කොමිෂන් සභා සාමාජික, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (2003 සිට 2005); සභාපතිනි, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (2005 -2012)

**විද්‍යාජෝති මහාචාර්ය කේ.කේ.වයි.ඩබ්. පෙරේරා**



ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු විද්‍යා මහාචාර්ය: සභාපති, නවීන තාක්ෂණය පිලිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය; නිර්මාතෘ හා සභාපති, NERD ආයතනය (1974-1977); සභාපති, ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය(1977-1989); ලේකම්, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය (1981-1990) සහ (2001-2003); සභාපති, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (1985-1986); ගරු මහාචාර්ය, මොරටුව විශ්වවිද්‍යාලය; අධ්‍යක්ෂක, ADB විද්‍යා හා තාක්ෂණ පිරිස් සංවර්ධන ව්‍යාපෘතිය (1997-2001)

**මහාචාර්ය එච්.පී.එම්. ගුණසේන**



ශෂ්‍ය විද්‍යාඥ: භෝග විද්‍යාව පිළිබඳ සම්මානිත මහාචාර්ය, පේරාදේණිය විශ්වවිද්‍යාලය (1982); හිටපු විධායක අධ්‍යක්ෂ, කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති කවුන්සලය; පීඨාධිපති, කෘෂි විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, (1982-1994); අධ්‍යක්ෂ, වයඹ විශ්වවිද්‍යාලය (1996-1998); අධ්‍යක්ෂ, කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (1997 - 2002); සාමාජික විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (1999-2005); අධිශිෂ්‍යත්ව ලාභී, ජාතික විද්‍යා ඇකඩමිය, උපදේශක, කෘෂිකර්ම අමාත්‍යාංශය (2007 සිට මේ දක්වා)

**ආචාර්ය සී.ටී.එස්. බී.පෙරේරා**



කර්මාන්ත විශේෂඥ: කළමනාකාර අධ්‍යක්ෂ, සැම්සන් රජරට ටයිල්ස් පුද්ගලික සමාගම; අධ්‍යක්ෂ, සීමාසහිත පිරමල් වීදුරු [සිලෝන්] සමාගම; අධ්‍යක්ෂ, සීමාසහිත කැළණි කේබල්ස් සමාගම; අධ්‍යක්ෂ, සීමාසහිත දන්කොටුව පෝසිලේන් සමාගම, උප සභාපති, මහජන උපයෝගිතා කොමිෂන් සභාව; මාණ්ඩලික සාමාජික, CRIB; අධ්‍යක්ෂ, ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව

**වෛද්‍ය පාලිත අබේකෝන්**



වෛද්‍ය: ජ්‍යේෂ්ඨ උපදේශක, ලෝක සෞඛ්‍ය සංවිධානය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය; හිටපු අධ්‍යක්ෂ, සෞඛ්‍ය පද්ධති සංවර්ධනය හා සෞඛ්‍ය තාක්ෂණය (WHO), අග්නිදිග ආසියානු කලාපය; ජ්‍යේෂ්ඨ ටකෙම් අධිශිෂ්‍යත්වලාභී, හා(ර්)වඩ් විශ්වවිද්‍යාලය; අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, අන්තර්ජාතික රෝග සායනික ජාලය, අග්නිදිග ආසියාතික වෛද්‍ය අධ්‍යාපන සංගමය සහ අග්නිදිග ආසියානු මහජන සෞඛ්‍ය අධ්‍යාපන ජාලය (WHO); සභාපති, ශ්‍රී ලංකා ඒඩ්ස් පදනම

**මහාචාර්ය ඩබ්.ඩී. ලක්ෂ්මන්**




ආර්ථික විද්‍යාඥ: කොළඹ විශ්වවිද්‍යාලය;  සභාපති, සමාජ විද්‍යාඥ සංගමය (1986-1988,1994); සභාපති, ශ්‍රී ලංකා ආර්ථික විද්‍යාඥයන්ගේ සංගමය (1990-1993); පීඨාධිපති, උපාධි අධ්‍යයන පීඨය (1992-1994); අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා පදනම් ආයතනය (1995-1997); උපකුලපති, කොළඹ විශ්වවිද්‍යාලය (1994-1999); සභාපති, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය; උප සභාපති, ජාතික සංවර්ධන කවුන්සලය; අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, නරේසා (1997-1998); බාහිර මහාචාර්ය, ර්යුකොකු විශ්වවිද්‍යාලය, ජපානය (1999-2001); ආර්ථික විද්‍යාව පිළිබඳ ජ්‍යේෂ්ඨ මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය, ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය, සාගා විශ්වවිද්‍යාලය, ජපානය (2004-2005)

# ආයතනික ආකෘතිය

- සභාපතිවරයා කොමිසමේ ප්‍රධානියා ය.
- අධ්‍යක්ෂවරයා ප්‍රධාන විධායක නිළධාරියා ය.
- ප්‍රතිපත්ති, සැලසුම්, වාර්තා සහ අනෙකුත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ ලේඛන සකසන විශේෂඥ අධ්‍යයන කණ්ඩායම් සහ උපදේශක සංසද සඳහා පහසුකම් සැලසීම සහ කළමනාකරණය කිරීම විද්‍යාත්මක වැඩසටහන් කළමනාකරුවන් විසින් සිදු කෙරේ.
- විධායක ලේකම්, කොමිෂන් සභාවේ ලේකම් ලෙස මෙන්ම කාර්යාල කළමනාකරු ලෙසද කටයුතු කරයි.
- ගණකාධිකාරීවරයා සියළු මූල්‍ය කටයුතු කළමනාකරණය කරයි.
- කොමිසමේ අවශ්‍යතාවය මත විශේෂිත කාර්යයන් සහ පැවරුම් සඳහා පර්යේෂණ සහකාරවරුන් සහ උපදේශකවරුන් බඳවාගනු ලැබේ.

# ආයතනික ව්‍යුහය




තනි ඉරි [ _ ] වලින් දැක්වෙන්නේ ස්ථිර තනතුරුය

කඩ ඉරි [ --- ] වලින් දැක්වෙන්නේ තාවකාලික තනතුරුය

# විද්‍යා හා තාක්ෂණ සමාලෝචනය

## රටේ විද්‍යා හා තාක්ෂණ තත්වය පිලිබඳ වාර්ෂික සමාලෝචනය

මෙම සමාලෝචනය සඳහා අප විසින් දත්ත/තොරතුරු ඉල්ලුම් කරන ලද සියලුම ආයතන අතුරින් ආයතන 25ක් පමණක් ප්‍රතිචාර දක්වන ලදී. දත්ත එකතු කිරීම පිළිබඳව කොමිසම සම- කටයුතු කිරීම සඳහා එම ආයතන ඔවුන්ගේ සම්බන්ධීකරණ නිළධාරීන් පත් කරන ලද අතර දත්ත එකතු කිරීමේ ආකෘතියේ අන්තර්ගතයන් සහ සමාලෝචනයේ ගැඹුර පිළිබඳ පැහැදිලි කිරීමට ඔවුන්ගේ රැස්වීමක් 2012 ජනවාරි 23 දින පවත්වන ලදී. එම රැස්වීමේදී පැවති සාකච්ජාව මත පදනම්ව, භාරගන්නා ලද ප්‍රශ්නාවලිය සංශෝධනය කර නැවත එම ආයතන වෙත යවන ලදී. දත්ත/තොරතුරු ඉදිරිපත් කිරීමට ලබාදුන් අවසන් දිනය 2012 මාර්තු 15 වුවද, විවිධ හේතූන් නිසා ඒවා ලබා දීම 2012 ජුනි දක්වා සිදුවිය. දත්ත හා තොරතුරු නිවැරදි භාවය සනාථ කර අඩුපාඩු සම්පූර්ණ කිරීමෙන් පසුව අතුරු වාර්තාවක් සම්පාදනය කරන ලදී. අවසාන වාර්තාව 2012 අවසානය වන විට සංස්කරණය වෙමින් පැවතිණ.

## විද්‍යා හා තාක්ෂණ ආයතන සමාලෝචනය

1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ විධි නියෝගය පරිදි විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් විද්‍යා හා තාක්ෂණ ආයතනවල ප්‍රගතිය සමාලෝචන කර රජයට වාර්තා කළ යුතුය.

2012 වර්ෂයේදී සමාලෝචනය කිරීම සඳහා සැලසුම් කරන ලද ආයතන වූයේ කාර්මික තාක්ෂණ ආයතනය, නවීන තාක්ෂණය සඳහා වන ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය, ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය සහ මූලික අධ්‍යයන ආයතනය යන ආයතනයන්ය. මෙම ආයතන 4 අතුරින් කාර්මික තාක්ෂණ ආයතනය, මූලික අධ්‍යයන ආයතනය හා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය යන ආයතන වල සමාලෝචනයන් ඔවුන්ගේ ස්වයං ඇගයීම් වාර්තා ඉදිරිපත් කිරීමට ප්‍රමාද වීම හේතුවෙන් කල් දමන ලදී.

### ➢ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ සමාලෝචනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සමාලෝචනය කළේ ආපදා කලමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් කරන ලද විශේෂ ඉල්ලීමක් මත පදනම්වය. සම්පූර්ණ කරන ලද ස්වයං ඇගයීම් වාර්තාව ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවට ලැබුණේ 2012 මාර්තු මස දීය. ඉක්බිති ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේද එකගත්වය ඇතිව සාමාලෝචන කමිටුව පත් කරන ලදී. සමාලෝචන කමිටුව පහත සාමාජිකයින් ගෙන් සමන්විත විය.

| | |
|---|---|
| මහාචාර්ය උපුල් සොන්නාදර (සභාපති) | - ජ්‍යේෂ්ඨ මහාචාර්ය, භෞතික විද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය ටී. ආර්. අරියරත්න | - ජ්‍යේෂ්ඨ මහාචාර්ය, භෞතික විද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |
| ඒ. එන්.ආර්. අමරතුංග මයා | - අමාත්‍ය ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය |
| ආචාර්ය බී. වී. ආර්. පුන්‍යවර්ධන | - ස්වභාවික සම්පත් කලමනාකරණ මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |

සමාලෝචන මණ්ඩලයේ ප්‍රථම රැස්වීම 2012 මාර්තු 16 දින පවත්වන ලදී. සමාලෝචන කමිටුව 2012 මැයි මස 10 සහ 11 දෙදින කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට ගොස් සමාලෝචන කටයුතු සිදු කරන ලදී. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ සේවා ලාභීන්ගෙන්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් සැපයෙන සේවාවන් පිළිබඳව අදහස් හා ගුණදොස් ලබාගැනීම සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් සේවාලාභීන් ගේ රැස්වීමක් 2012 මැයි 25 දින සංවිධානය කරන ලදී.

සමාලෝචන කමිටු රැස්වීම් කිහිපයකට පසුව සමාලෝචන වාර්තාවේ පළමු කෙටුම්පත 2012 සැප්තැම්බර් මස 11 දින කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වෙත භාර දෙන ලදී.

කෙටුම්පත් වාර්තාව පිළිබඳ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ගුණදොස් 2012 ඔක්තෝබර් 08 දින ලබා දුන් අතර එම ගුණදොස් වලට අනුව වාර්තාව මදක් වෙනස් කරන ලදී. අවසාන සමාලෝචන වාර්තාව 2012 දෙසැම්බර් මස 19 දින කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

## ➢ නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානයේ සමාලෝචනය

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානයේ ස්වයං ඇගයීම් වාර්තාව ලැබීමෙන් අනතුරුව, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානයේ එක- ත්වය සහ තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව පහත සමාලෝචන කණ්ඩායම පත් කරන ලදී.

| | |
|---|---|
| ආචාර්ය එස්.ඒ.කේ. අභයවර්ධන (සභාපති) | - හිටපු අධ්‍යක්ෂ, ජාතික විද්‍යා පදනම |
| මහාචාර්ය එච්. එස්. සී. පෙරේරා | - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය |
| ආචාර්ය ගාමිණී විජයරත්න | - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කාර්මික කළමනාකරණ දෙපාර්තමේන්තුව, විද්‍යා පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය |
| ජී.බී. විමලරත්න මයා | - හිටපු වැඩ බලන සාමාන්‍ය අධිකාරී, ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය |
| ජී. ප්‍රසාද් ජීරසිංහ මයා | - මානව සම්පත් කළමනාකරණය පිළිබඳ බාහිර කථිකාචාර්ය, පිරිස් කළමනාකරණ ආයතනය |

සමාලෝචන කමිටුවේ ප්‍රථම රැස්වීම 2012 අගෝස්තු 17 දින පැවැත්වූ අතර සමාලෝචන කමිටුව 2012 සැප්තැම්බර් 10 සහ 11 යන දෙදින ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය වෙත ගොස් ආයතනය සමාලෝචනය කරන ලදී.

ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානයේ සේවාලාභීන්ගේ අදහස් ලබා ගැනීම සඳහා වූ රැස්වීම 2012 සැප්තැම්බර් 19 දින ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේදී පවත්වන ලදී. සමාලෝචන මණ්ඩල රැස්වීම් කිහිපයකින් පසුව සමාලෝචන වාර්තාවේ පළමු කෙටුම්පත සකස් කරන ලද අතර 2012 ඔක්තෝම්බර් 23 දින ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය වෙත ඔවුන්ගේ ගුණදොස් හා කරුණු සත්‍යාපනය සඳහා ඉදිරිපත් කරන ලදී.

## ➢ මූලික අධ්‍යයන ආයතනය, කාර්මික තාක්ෂණ ආයතනය, ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය සමාලෝචනය

මූලික අධ්‍යයන ආයතනය, කාර්මික තාක්ෂණ ආයතනය සහ ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය යන ආයතන වල ස්වයං ඇගයීම් වාර්තා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත ලැබුණේ 2012 අවසාන කාර්තුවේය. එමනිසා, එම ආයතනයන් හි සමාලෝචනයන් 2013 වර්ෂයට කල් දමන ලදී.

# ජාත්‍යන්තර සබඳතා

## නාම් මධ්‍යස්ථානය විසින් ලබාදෙනු ලැබූ පුහුණු අවස්ථා

ඉන්දියාවේ පිහිටා ඇති නොබැඳි ජාතීන්ගේ සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය අන්තර් රාජ්‍ය සංවිධානයකි. සංවර්ධනය වෙමින් පවතින රටවලට අදාළ විද්‍යා හා සමාජ ආර්ථික ගැටළු පිළිබඳ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම එහි කාර්යයන් අතුරින් එකකි.

2012 වසර තුළදී නස්ටෙක් ආයතනය නාම් මධ්‍යස්ථානය හරහා ශ්‍රී ලාංකික නිලධාරීන් 06 දෙනෙකුට පුහුණු අවස්ථාවන් ලබාදෙන ලදි. එවා නම්;

1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම නියාමන නිලධාරී ජේ. බී. එල්. ජයසිංහ මහතා නාම් මධ්‍යස්ථානය හා CFTRI ආයතනය මගින් ප්‍රදානය කරනු ලබන ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ සය මස් (2012 ඔක්තෝබර් සිට 2013 මාර්තු තෙක්) ඒකාබද්ධ අධි ශිෂ්‍යත්වය සඳහා තෝරාගන්නා ලදි.

2. නස්ටෙක් ආයතනයේ විද්‍යා වැඩසටහන් කළමණාකාරිනී, ආශා පිටදෙනිය මෙනවිය දියුණු වෙමින් පවතින රටවල විද්‍යා හා තාක්ෂණ උපායන් පිළිබඳ අන්තර්ජාතික වැඩමුළුවේදී ශ්‍රී ලංකාව නියෝජනය කලාය. මෙම වැඩමුළුව 2012 මැයි මස 13 - 16 කාලය තුලදී ඉරානයේදී පැවැත්විණි.

3. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කතිකාචාර්යවරියක වන බානුකී ජයසූරිය මහත්මියට නාම් මධ්‍යස්ථානය හා ICCBS ආයතනය එක්ව ප්‍රදානය කරනු ලබන ස්වාභාවික නිපැයුම් රසායනික විද්‍යාව / බෙහෙත් හා ඖෂධ පිළිබඳ සය මස් අධි ශිෂ්‍යත්වය පිරිනමන ලදි.

4. බුද්ධිමය දේපල අයිතිය පිළිබඳ සමකාලීන කලමණාකරන උපායමාර්ග පිළිබඳව වූ අන්තර්ජාතික සමුළුව 2012 ජුලි මස 16-20 දිනයන්හීදී ඉන්දියාවේදී පවත්වන ලද අතර, කාර්මික තාක්ෂණ ආයතනයේ ආයතන ලේකම්, රේනුකා ජයතිලක මහත්මිය එම පුහුණු වැඩසටහනට සහභාගී වූවාය.

5. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ භූ විද්‍යාඥ, ඇන්ටන් ජයකොඩි මහතා, 2012 සැප්තැම්බර් මස 25-27 දිනයන්හීදී දකුණු අප්‍රිකාවේදී පවත්වන ලද ඛණිජ පිරිසැකසුම හා ප්‍රතිලාභ පිළිබඳ අන්තර්ජාතික වැඩමුළුවට සහභාගී විය.

6. කාර්මික තාක්ෂණ ආයතනයේ පර්යේෂණ විද්‍යාඥ ආචාර්ය සඳුන් දල්පදාදු මහතා, 2012 දෙසැම්බර් මස 2-6 තෙක් ඊජිප්තුවේ කයිරෝ නුවර පැවති කාර්මික ජෛව තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික වැඩමුළුවට සහභාගී විය.

# අනෙකුත් නැස්ටෙක් ක්‍රියාකාරකම්

## තරුණ විද්‍යාඥ සංසදය

### ➤ තරුණ විද්‍යාඥ සංසදයේ සම්මන්ත්‍රණය හා වාර්ෂික මහා සභා රැස්වීම 2011

තරුණ විද්‍යාඥ සංසදය ප්‍රථම වතාවට එහි සාමාජිකයන්ගේ පර්යේෂණ වැඩකටයුතු විද්‍යා ප්‍රජාවට ඉදිරිපත් කිරීම සඳහා සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදි. මෙම සම්මන්ත්‍රණය 2012 ජනවාරි 27 දින කොළඹ, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පැවති තරුණ විද්‍යාඥ සංසදයේ වාර්ෂික රැස්වීම සමග පවත්වන ලදි.

උද්ධෘත පත්‍රිකා කැඳවීම සඳහා වූ අපගේ ඉල්ලීමට ප්‍රතිචාර ලෙස සංසදයේ සාමාජිකයන්ගෙන් උද්ධෘත පත්‍රිකා 76ක් ලැබුණි. මෙම එක් එක් උද්ධෘත පත්‍රිකාවක් ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින් දෙදෙනෙකු විසින් ඒකවිධ උපමානයන් යොදාගනිමින් ඇගයීම කරන ලදි. සම්මන්ත්‍රණය සමගාමී සැසිවාර දෙකකින් යුක්ත වූ අතර වාචික ඉදිරිපත්කිරීම් 28 කින් සමන්විත විය. පෝස්ටර් ඉදිරිපත්කිරීමක් ද පැවති අතර පෝස්ටර් 20ක් එහිදී ඉදිරිපත් කර තිබුණි. තෝරාගත් සියළුම ඉදිරිපත්කිරීම් සංසදයේ සම්මන්ත්‍රණ කාර්යය වාර්තාවේ ප්‍රකාශයට පත් කරන ලදි.

ආරාධිත ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින් මෙම සැසිවාරයන් හි විනිශ්චයකරුවන් ලෙස ක්‍රියාකල අතර සෑම සැසියකම විශිෂ්ඨ වාචික ඉදිරිපත් කිරීම් 3 ට හා විශිෂ්ඨ පෝස්ටර් ඉදිරිපත් කිරීම් 5 ට කුසලතා සහතික ප්‍රදානය කරන ලදි.

වාර්ෂික මහ සභා රැස්වීමේදී 2012 වසර සඳහා නව කාරක සභාවක් පත්කරන ලදි. එම සභාවේ සාමාජිකයන් වූයේ,

චින්තන් මනෝරත්න මහතා (සභාපති), පර්යේෂණ නිලධාරී, කාර්මික තාක්ෂණ ආයතනය; උවසරා දිසානායක මෙනවිය, කතිකාචාරිනී, පේරාදෙණිය විශ්වවිද්‍යාලය; කේමින්ද හේරත් මහතා, කතිකාචාර්ය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය; එම්. සී. එම්. සකීල් මහතා, කතිකාචාර්ය, රජරට විශ්වවිද්‍යාලය; සුදර්ශන් සෝමසිරි මහතා, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ, කාර්මික තාක්ෂණ ආයතනය; ක්‍රිස්ටීන් දසනායක මෙනවිය, විද්‍යා නිලධාරී, ජාතික විද්‍යා පදනම; ආචාර්ය බුද්ධිකා අරුග්ගොඩ, ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය; මෙනුකා උඩුගම මෙනවිය, කතිකාචාර්ය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය; ආචාර්ය නිලුක්ෂි ලියනගුනවර්ධන, පශු පර්යේෂණ නිලධාරී, පශු පර්යේෂණ ආයතනය; සිදත් බන්ඩාර මහතා, පර්යේෂණ නිලධාරී, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය; ගීතානි සමරසිංහ මහත්මිය, පර්යේෂණ නිලධාරී, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය; සී. එන්. නුපේආරච්චි මෙනවිය, බාහිර කථිකාචාර්ය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය



වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගී වූවන්




සම්මන්ත්‍රණය සමාරම්භ කරමින්



තරුණ විද්‍යාඥ සංසද සම්මන්ත්‍රණයේ එක් සමාන්තර සැසියකට සහභාගී වූ සහභාගිකයන් කිපදෙනෙක්

## වාචික සැසිවාර වල ජයග්‍රාහකයන්

- **ඒ. එම්. එච්. එච්. අබේකෝන් මහතා, මොරටුව විශ්වවිද්‍යාලය**
  සමකර්තෘ වරුන් : ඒ. යූ. දිසානායක, සී. ආර්. ද සිල්වා, එල්. ජී. ටී. කෞශල්‍යා, එස්. එස්. වීරවර්ධන, එම්. ඒ. එෆ්. නජ්ලා
- **ආචාර්ය එච්. ඩී. ඩී. බන්ධුප්‍රිය, පොල් පර්යේෂණ ආයතනය**
  සමකර්තෘ : ජේ. එම්. ඩන්වෙල්
- **ආචාර්ය සජානි ඩයස්, කොළඹ විශ්වවිද්‍යාලය**
  සමකර්තෘ වරුන් : පී. එච්. ප්‍රේමරත්න, පී. වී. උඩගම
- **ඒ. අයි. ගුනරත්න මහතා, මොරටුව විශ්වවිද්‍යාලය**
  සමකර්තෘ වරුන් : ඒ. ජී. පී. අබේගොඩ, එන්. අයි. කටුගම්පල, එච්. ඒ. ඩී. ඩබ්ලිව්. බන්ඩාර, එස්. ජේ. සූරියආරච්චි
- **එස්. එම්. එම්. ඉක්‍රම් මහතා, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය**
  සමකර්තෘ වරුන් : යූ. කේ. ජයසිංහ මුදලිගේ, ජේ. සී. එදිරිසිංහ
- **එන්. ටී. ජයවික්‍රම මෙනවිය, කැලණිය විශ්වවිද්‍යාලය**
  සමකර්තෘ : වී. පී. ඒ. වීරසිංහ
- **ආචාර්ය එන්. ලියනගුනවර්ධන, පශු පර්යේෂණ ආයතනය**
  සමකර්තෘ වරුන් : ජී. ආර්. රාජපක්ෂ, එල්. එම්. පී. විජේමාන්න, ඩබ්ලිව්. එම්. පී. බන්ඩාර, ජී. විජේවර්ධන, පී. එස්. ප්‍රනාන්දු, එම්. ඒ. ආර්. ප්‍රියන්ත, ජී. ඒ. ගුනවර්ධන
- **එම්. කේ. මීගහකුඹුර මහතා, පොල් පර්යේෂණ ආයතනය**
  සමකර්තෘ වරුන් : එල්. පෙරේරා, එච්. ආර්. ටී. විජේසේකර, ඩබ්ලිව්. බී. එස්. ප්‍රනාන්දු, එන්. ජී. ඒ. කලනි, එම්. ජේ. ඩිකින්සන්
- **සී. එන්. නූපේආරච්චි, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
  සමකර්තෘ වරුන් : සී. ඒ. තොටවත්තගේ, ජී. කේ. ආර්. සේනාධිර, වී. පී. එස්. පෙරේරා
- **ආචාර්ය ඒ. එස්. පෙරේරා, මොරටුව විශ්වවිද්‍යාලය**
  සමකර්තෘ වරුන් : කේ. එම්. සී. ජයරත්න, ඩී. සී. ප්‍රනාන්දු, අයි. එල්. හත්තොටුව, ඩී. ඒ. සී. මධුරන්ගි
- **කේ. ප්‍රසන්නාත් මහතා, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය**
  සමකර්තෘ වරුන් : එස්. කරුනාකරන්, එස්. මහෙන්ද්‍රන්
- **ජේ. එම්. එම්. උඩුගම, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය**
  සමකර්තෘ : යූ. කේ. ජයසිංහ මුදලිගේ

## පෝස්ටර් සැසිවාරයේ ජයග්‍රාහකයන්

- **ටී. කිෂාන්තන් මහතා, මොරටුව විශ්වවිද්‍යාලය**
  සමකර්තෘ වරුන් : එස්. පෙරේරා, කේ. ඩී. ඒ. කේ. එස්. පෙරේරා, එච්. ඒ. එස්. පෙරේරා, ඩී. ටී. එච්. වී. මාදොල, එම්. වල්පොල
- **කේ. වී. වී. එස්. කුඩලිගම මෙනවිය, රබර් පර්යේෂණ ආයතනය**
  සමකර්තෘ වරුන් : වී. එච්. එල්. රොද්‍රිගු, කේ. එම්. ඊ. පී. ප්‍රනාන්දු, පී. ඒ. ජේ. යාපා
- **ආචාර්ය ඒ. එස්. පෙරේරා, මොරටුව විශ්වවිද්‍යාලය**
  සමකර්තෘ වරුන් : ඒ. එච්. කේ. ලක්ප්‍රිය, එම්. පී. ඒ. පී. සිල්වා, ඒ. පී. ඒ. ඊ. සුදාර්ක, ඒ. එස්.ටී. සෝමසිරි
- **ඒ. කේ. වික්‍රමසූරිය මහතා, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය**
- **ආචාර්ය සී. විජයසිරිවර්ධන, කාර්මික තාක්ෂණ ආයතනය**
  සමකර්තෘ වරුන් : ඩබ්ලිව්. පී. කේ. එම්. අබේසේකර, ජී. ඒ. එස්. ප්‍රේමකුමාර







හොඳම ඉදිරිපත් කිරීම් වෙනුවෙන් කුසලතා සහතික ප්‍රධානය

## ➢ තරුණ විද්‍යාඥ සංසදයේ සම්මාන ප්‍රධානය - 2011

තරුණ විද්‍යාඥයින් දිරිමත් කිරීමට හා ඔවුන්ගේ ජයග්‍රහණයන් අගය කිරීම උදෙසා 2006 වසරේදී ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව තරුණ විද්‍යාඥ සම්මාන ප්‍රධානය ආරම්භ කරන ලදි. තරුණ විද්‍යාඥ සංසදයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී මෙම සම්මාන ප්‍රධානය වාර්ෂිකව සිදුකෙරේ.

මෙම සම්මාන භාණ්ඩ 2ක් යටතේ ප්‍රධානය කරනු ලබයි; එනම් විද්‍යාත්මක පර්යේෂණ සහ විද්‍යාව ජනප්‍රිය කිරීම හා ප්‍රවර්ධනය. අදාල ක්ෂේත්‍රයන් හි විශිෂ්ඨතා දක්වන තරුණ විද්‍යාඥ සංසදයේ සාමාජිකයන්ට මෙම සම්මාන පිරිනැමේ. සෑම සම්මානයක්ම මුදල් ත්‍යාගයකින් හා සහතික පත්‍රයකින් සමන්විත වේ.

ජාත්‍යන්තර ආයතනය සම්මාන ලාභීන් තෝරාගැනීම සඳහා පහත සඳහන් පුද්ගලයන්ගෙන් සමන්විත ඇගයීම් කමිටුවක් පත් කරන ලදි.

මහාචාර්ය සාගරිකා ඒකනායක - ප්‍රධානී, ජීව රසායන විද්‍යා දෙපාර්තමේන්තුව,
වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ආචාර්ය එවරාඩ් ජයමාන්න - නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)
පොල් පර්යේෂණ ආයතනය, ලුණුවිල

මහාචාර්ය රුචිරා කුමාරනතුංග - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, ධීවර හා සමුද්‍ර විද්‍යා හා තාක්ෂණ පීඨය,
රුහුණු විශ්වවිද්‍යාලය

විද්‍යාව ජනප්‍රිය කිරීම හා ප්‍රවර්ධනය සඳහා වන සම්මානය සඳහා සුදුසුකම් සපුරා ලූ අපේක්ෂකයින් කිසිවෙක් නොවීය. එසේ වුවත්, විද්‍යාත්මක පර්යේෂණ භාණ්ඩය යටතේ අපේක්ෂකයන් දෙදෙනෙක් එක සමාන ලෙස දක්ෂකම් දක්වා තිබූ හෙයින් ඒ යටතේ සම්මාන දෙකක් ප්‍රධානය කරන ලදි.

එම සම්මාන ප්‍රධානය කරන ලද්දේ පහත සඳහන් විද්‍යාඥයින් දෙදෙනාටය

### විද්‍යාත්මක පර්යේෂණ විශිෂ්ඨත්වය සඳහා වූ තරුණ විද්‍යාඥ සම්මාන



**මහාචාර්ය උදිත් ජයසිංහ**
**කෘෂිකර්ම ව්‍යාපාර කළමණාකරන දෙපාර්තමේන්තුව**
**වතු කළමණාකරන හා කෘෂිකර්ම පීඨය**
**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය**



**ආචාර්ය රූපිකා රාජකරුණා**
**සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව**
**විද්‍යා පීඨය**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

## ➢ ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන - "මූලික ජීව තාක්ෂණය සහ අණුක ජීව විද්‍යාව"

මූලික ජීව තාක්ෂණය සහ අණුක ජීව විද්‍යාව පිළිබඳව ගුරු පුහුණු වැඩසටහනක් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව, එහි තරුණ විද්‍යාඥ සංසදය හා අනුරාධපුර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලයේ සහයෝගීත්වය ඇතිව සංවිධානය කරන ලදි. මෙම වැඩසටහන 2012 මාර්තු මස 22 හා 23 දිනයන්හිදී අනුරාධපුරයේදී පැවැත්වීමට යෙදිණි.

ජීව තාක්ෂණය සහ අණුක ජීව විද්‍යාව යන ක්ෂේත්‍රයන්ට අදාලව උසස්පෙළ ගුරුවරුන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන මෙම වැඩසටහන පවත්වන ලදි. DNA වල ලක්ෂණ, ශාක පටක රෝපණය, එන්සයිම, ජාන ක්ලෝනකරණය, ජානමය වශයෙන් වෙනස් කල ජීවීන්, සහ කෘෂි, වෛද්‍ය හා කාර්මික යන අංශ යන්හි ඒවායේ භාවිතයන් මෙන්ම ජානමය වශයෙන් වෙනස් කල ජීවීන් සම්බන්ධයෙන් ඇති සමාජමය ප්‍රශ්න වැනි විෂය ක්ෂේත්‍රයන් මෙහිදී ආවරණය කරන ලදි.

උතුරු මැද පළාතේ උසස් පෙළ විද්‍යා ගුරුවරු 70 ක් පමණ මෙම වැඩසටහනට සහභාගී වූහ. වැඩසටහන අවසානයේදී, ඇගයීම් පත්‍රිකාවක් සහභාගීවූවන් අතර බෙදාදුන් අතර, එහිදී වැඩසටහනේ ඵලදායකත්වය ඉතාම උසස් බවට ශ්‍රේණිගතකර තිබුණි.

පහත සඳහන් සම්පත් දායකයන් මෙම පුහුණු වැඩසටහන මෙහෙය වන ලදි.

- **ශාක පටක රෝපණය**
  මහාචාර්ය පී. ඒ. වීරසිංහ
  පීඨාධිපති
  කෘෂිකර්ම පීඨය
  රජරට විශ්වවිද්‍යාලය

- **DNA සමග ක්‍රියාකරන එන්සයිම, ඇගරෝස් ජෙල් විද්‍යුතාගමනය, DNA ඇඟිලි සලකුණු මුද්‍රණය, ප්‍රතිසංයෝජක DNA තාක්ෂණය සහ ජාන ක්ලෝනකරණය, ජානමය වශයෙන් විකරණය කල ජීවීන්**
  එම්. සී. එම්. සකීල් මහතා
  ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය
  කෘෂිකර්ම පීඨය
  රජරට විශ්වවිද්‍යාලය

- **DNA වල ලක්ෂණ, DNA නිස්සාරනය, DNA දෙමුහුන්කරණය, බැක්ටීරියා ප්ලාස්මිඩ සහ වෛරස් වල ජානමය ද්‍රව්‍ය, සහ DNA තාක්ෂණයේදි යොදාගන්නා වාහකයන්**
  ආචාර්ය ටී. සී. බමුණුආරච්චිගේ
  දෙපාර්තමේන්තු ප්‍රධානී
  ව්‍යවහාරික විද්‍යා පීඨය
  රජරට විශ්වවිද්‍යාලය





අනුරාධපුරයේ පැවති ගුරු පුහුණු වැඩසටහනට සහභාගී වූවන්

## ➢ "නවීකරණය සහ නවෝත්පාදනය" වැඩමුළුව

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් තරුණ විද්‍යාඥ සංසදයේ සහයෝගීත්වය ඇතිව සංවිධානය කරන ලද නවීකරණය සහ නවෝත්පාදනය වැඩමුළුව 2012 වර්ෂයේ ජුනි 26 දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ සහ පුහුණු ආයතනයේදී පැවැත්විනි. ජාතික නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ සභාපති දීපාල් සූරිය ආරච්චි මහතා වැඩමුළුව මෙහෙය විය.

මෙම වැඩමුළුවේ අරමුණ වූයේ නවෝත්පාදන ක්‍රියාවලියට අන්තර්දෘෂ්ඨියක් සැපයීම සහ තරුණ විද්‍යාඥයින්, ඔවුන් විශේෂඥතා දක්වන ක්ෂේත්‍ර තුළ නවෝත්පාදනය සඳහා පෙළඹවීමයි.

වැඩමුළුවේ සම්පත් දායකයා වූ සූරියආරච්චි මහතා, සමාජයේ ප්‍රශ්ණ හඳුනාගෙන එම ප්‍රශ්ණවලට මුහුණ දීම සඳහා නිර්මාණාත්මක විසඳුම් සොයාගන්නා අයුරු සරල නිමැවුම් උදාහරණ ලෙස ගනිමින් විස්තර කළේය.

මෙම වැඩමුළුව සඳහා 80කට වැඩි පිරිසක් සහභාගී වූහ. සහභාගීවූවන් වූයේ විශ්වවිද්‍යාල ශාස්ත්‍රඥයින්, පර්යේෂණ නිළධාරීන් සහ විද්‍යා හා තාක්ෂණ සහ පර්යේෂණ හා සංවර්ධන ආයතන වලට සම්බන්ධ පරිපාලකයන්ය.

## ➢ "පර්යේෂණ ආචාර ධර්ම වැඩමුළුව"

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ A අංශයේ (වෛද්‍ය, දන්ත වෛද්‍ය සහ පශු වෛද්‍ය ) සහයෝගීත්වය ඇතිව විද්‍යාඥයන් සඳහා වැඩමුළුවක් සංවිධානය කරන ලදී.

මෙම වැඩමුළුව 2012 අප්‍රේල් මස 20 වන දින පර්යේෂණ ආචාර ධර්ම යන මාතෘකාව යටතේ කොළඹ 07 විජේරාම මාවතේ පිහිටි ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගම් ශ්‍රවණාගාරයේදී පැවත්විනි.

විද්‍යාත්මක පර්යේෂණ වලදී ආචාර ධර්ම වල වැදගත්කම පිළිබඳ දැනුම බෙදාදීම මෙම වැඩමුළුවේ අරමුණයි.

සත්ව සහ මානව පර්යේෂණ සඳහා ආචාරධර්ම වල අදාලතාවය, අචාර ධර්ම සමාලෝචන ක්‍රියාවලිය සහ පර්යේෂණ වලදී අචාර ධර්ම වල විද්‍යාත්මක වලංගුභාවය යන ක්ෂේත්‍රයන් මෙම වැඩමුළුවේදී ආවරණය විය. පහත සම්පත් දායකයන් විසින් මෙම වැඩමුළුව මෙහෙයවන ලදී.

- **පර්යේෂණ ආචාර ධර්ම සහ අචාර ධර්ම සමාලෝචන ක්‍රියාවලිය හැඳින්වීම**

  ආචාර්ය චාන්දනී වනිගතුංග<br>
  (සභාපතිනි, අචාර ධර්ම සමාලෝචන කමිටුව/ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)<br>
  ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>
  ඖෂධ විද්‍යා දෙපාර්තමේන්තුව<br>
  වෛද්‍ය විද්‍යා පීඨය<br>
  ශ්‍රී ජයවර්ධන පුර විශ්වවිද්‍යාලය

- **"සත්ව පර්යේෂණ වලදී ආචාර ධර්ම ගැටළු"**

  ආචාර්ය මයුරි තම්මිටියාගොඩ<br>
  පශු වෛද්‍ය විශේෂඥ<br>
  වෛද්‍ය පර්යේෂණ ආයතනය

- **"විද්‍යාත්මක වලංගුභාවය සහ පර්යේෂණ අචාර ධර්ම"**

  ආචාර්ය වත්සලා ජයසූරිය<br>
  (ලේකම්, අචාර ධර්ම සමාලෝචන කමිටුව/ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)<br>
  ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>
  ප්‍රජා වෛද්‍ය විද්‍යා දෙපාර්තමේන්තුව<br>
  වෛද්‍ය විද්‍යා පීඨය<br>
  ශ්‍රී ජයවර්ධන පුර විශ්වවිද්‍යාලය

- **"අනාරක්ෂිත ගහන තුළ පර්යේෂණ සහ දැනුවත් එක- කාවය"**

  ආචාර්ය රසිකා පෙරේරා,<br>
  (සාමාජික, අචාර ධර්ම සමාලෝචන කමිටුව/ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)<br>
  ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>
  ජෛව රසායන විද්‍යා දෙපාර්තමේන්තුව<br>
  වෛද්‍ය විද්‍යා පීඨය<br>
  ශ්‍රී ජයවර්ධන පුර විශ්වවිද්‍යාලය

## ➢ "ඔබගේ සේවා ස්ථානයේ වඩා හොඳ කාර්යය සාධනයක් සඳහා ආතතිය පාලනය කිරීම " වැඩ මුළුව

මෙම වැඩමුළුව 2012 වර්ෂයේ ඔක්තෝබර් මස 19 වන දින ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ ශ්‍රවණාගාරයේදී පැවැත්විනි. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ තරුණ විද්‍යාඥ සංසදය ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ A අංශය හා ඒකාබද්ධව මෙම වැඩ මුළුව සංවිධානය කරන ලදී.

මෙම වැඩමුළුවේ අරමුණ වූයේ ආතතිය හට ගැනීමට බලපාන හේතු පිළිබඳ දැණුම ලබාදීම සහ ආතතිය මැඩපවත්වා ගන්නා ආකාරය පිළිබඳ සරල තාක්ෂණික ශිල්ප ක්‍රම හඳුන්වා දීමයි.

විශ්වවිද්‍යාල සහ උක් පර්යේෂණ ආයතනය, කාර්මික තාක්ෂණ ආයතනය, ජාතික විද්‍යා පදනම, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ සහ පුහුණු ආයතනය, රබර් පර්යේෂණ ආයතනය වැනි පර්යේෂණ සහ සංවර්ධන ආයතන වලින් ආසන්න වශයෙන් 60 දෙනෙකු පමණ මෙම වැඩමුළුවට සහභාගී වූහ.

වැඩමුළුවේදී පහත ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී.

- **සතුටින් සිටීම : ප්‍රතිඵලයක් ද? සම්පතක්ද ?**

ආචාර්ය මහේෂ් රාජසූරිය
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
වෛද්‍ය පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය සහ
මනෝචිකිත්සක උපදේශක,
ශ්‍රී ලංකා ජාතික රෝහල

- **ආතතිය අවම කිරීම සඳහා අවධානය**

ආචාර්ය පියන්ජලී ද සොයිසා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
වෛද්‍ය පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය

- **උද්‍යාන විද්‍යාව තුලින් ආතතියට සහනය**

ආචාර්ය කපිල යකන්දාවල
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
කෘෂිකර්ම සහ වගා කළමනාකරණ පීඨය
උද්‍යාන විද්‍යා සහ ගෙවතු අලංකරණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

# අපගේ කාර්ය මණ්ඩලය

## ♦ විධායක කාර්ය මණ්ඩලය

**වැඩබලන අධ්‍යක්ෂ**

ආචාර්ය මුදිත ලියනගෙදර
B.Sc., M.Phil (පේරාදෙණිය)
Ph.D (සෝල්)

**විද්‍යා වැඩසටහන් කළමනාකරුවන්**

ආචාර්ය මුදිත ලියනගෙදර
B.Sc., M.Phil (පේරාදෙණිය)
Ph.D. (සෝල්)

ආශා පිටදෙණිය මෙනෙවිය
B.Sc., M.Sc. (පේරාදෙණිය)

**ගණකාධිකාරිණී**

ජී.සී.කේ. පීරිස් මිය
B.Com (ශ්‍රී ජයවර්ධනපුර)

**විධායක ලේකම්**

රුක්මන් කුරේ බුලත්සිංහල මයා

## ♦ සහකාර කාර්යය මණ්ඩලය

**වැඩසටහන් සහකාර**

**පරිසනක යෙදවුම්**
එල්.ඒ.එල්.එන්. ලියනආරච්චි මිය (ජූලි දක්වා)
B.Sc. (සබරගමුව)

**මුදල්**
ආර්.එම්. තුසිත රත්නායක මයා
M.A.A.T.

**පර්යේෂණ සහකාරවරියන්**

ධනංජලී පෙරේරා මෙනෙවිය
(මාර්තු දක්වා)
B.Sc. (පේරාදෙණිය)

අමාලි ජයතිලක මෙනෙවිය
B.Sc. (සබරගමුව)

**පෞද්ගලික සහකාර වරියන්**

නිල්මිණී පෙරේරා මිය
සයුමි විජේසිංහ මෙනෙවිය
නිශාන්ති මහරගේ මෙනෙවිය

**පිළිගැනීමේ නිළධාරිණිය/ දුරකථන ක්‍රියාකාරිණිය**

දක්මිණී කරුණාතිලක මිය

**රියදුරන්**

එච්. ඒ. අනිල් කුමාර හෙට්ටිආරච්චි මයා
අයි. ජී. ජයශාන්ත ප්‍රභාත් මයා
එරන්ද ප්‍රදීප් මයා

**කාර්යාල කාර්යය සහායකයින්**

ඒ. ඩී. ධනපාල මයා
නිශාන්ත පියදාස මයා

# කාර්යය මණ්ඩල පුවත්

ජනවාරි මාසයේදී නව කළමණාකරන සහකාර, නිශාන්ති මහරගේ මෙනෙවිය නස්ටෙක් ආයතනය විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

මාර්තු මාසයේදී පර්යේෂණ සහායක ධනංජලී පෙරේරා මෙනෙවිය සිය සේවා ගිවිසුම් කාලය සම්පූර්ණ කර පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා ඉවත්ව ගියාය. නස්ටෙක් ආයතනයේ ගත කල කෙටි කාලය තුල ඇයගෙන් සිදුවූ සේවයට, කැපවීමට හා උනන්දුවට අපි ස්තුතිවන්ත වෙමු.

අගෝස්තු මාසයේදී පරිසණක වැඩසටහන් සහායිකා නිලූකා ලියනාරච්චි මහත්මිය ආයතනයෙන් සමුගෙන ගියාය. නස්ටෙක් ආයතනයේ සේවය කල කාලය තුල ඇය ඉතා උනන්දුවෙන් හා කැපවීමෙන් ලබා දුන් සේවය අපි ඉතා අගය කොට සළකමු. ඇයගේ අනාගත කාර්යන් සඳහා අපි සුභ පතන්නෙමු.

කෙටි කාලීන පැවරුමක් සම්පූර්ණ කිරීම සඳහා මාසයක කාලයක් නස්ටෙක් ආයතනය සම- සිටි රජරට විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂක සමීර ප්‍රියන්කර මහතාට අපි ස්තුති වන්ත වෙමු. ඔහු නස්ටෙක් වෙබ් අඩවිය පිළිසැකසුම් කළේය. ඔහුගේ උපාධිය සාර්ථකව නිම කර ගැනීම සඳහා අපි සුබ පතන්නෙමු.

## සේවක මණ්ඩලය සහභාගී වූ වැඩසටහන්

- ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ව්‍යාපාරය මගින් සංවිධානය කරන ලද සමුළුව 2012 වර්ෂයේ පෙබරවාරි 24 දින ගලදාරී හෝටලයේදී පැවැත්වුන අතර වැඩ බලන අධ්‍යක්ෂ ආචාර්ය මුදිත ලියනගෙදර මහතා ඊට සහභාගී විය.

- වැඩබලන අධ්‍යක්ෂ ආචාර්ය මුදිත ලියනගෙදර මහතා 2012 මාර්තු 20 වන දින තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශය මගින් සංවිධානය කරන ලද සංවර්ධන ප්‍රතිඵල සඳහා කළමනාකරණය වැඩමුළුවට සහභාගී විය.

- වැඩබලන අධ්‍යක්ෂ ආචාර්ය මුදිත ලියනගෙදර මහතා සහ විද්‍යා වැඩසටහන් කළමණාකාරිනී ආශා පිටදෙනිය මෙනෙවිය 2012 මාර්තු 30 වන දින ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය මගින් සංවිධානය කල පර්යේෂණ වානිජ්‍යකරණ වැඩමුළුවට සහභාගී වූහ.

- විද්‍යා වැඩසටහන් කළමණාකාරිනී ආශා පිටදෙනිය මෙනෙවිය ඉරානයේ ටෙහෙරාන් නුවර පැවති, ඉරාන නව්‍යකරණ සහ තාක්ෂණ සහයෝගිතා මධ්‍යස්ථානය සහ ඉන්දියාවේ නව දිල්ලි නුවර, නොබැඳි ජාතීන්ගේ සහ සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද, සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා විද්‍යා හා තාක්ෂණ චාතුර්යය පිළිබඳ වැඩමුළුවට සහභාගී වූවාය.

- වැඩබලන අධ්‍යක්ෂ ආචාර්ය මුදිත ලියනගෙදර මහතා සහ ගණකාධිකාරිනී කුමාරි පීරිස් මහත්මිය 2012.05.31 දින සේවක මණ්ඩල කළමණාකරන ආයතනය විසින් සංවිධානය කරන ලද සේවා ස්ථානයෙහි නොපැමිණියාව හැසිරවීම පිළිබඳ වැඩමුළුවට සහභාගී වූහ.

- වැඩ බලන අධ්‍යක්ෂ ආචාර්ය මුදිත ලියනගෙදර මහතා 2012 ජූලි 10-12 දක්වා ඉන්දුනීසියාවේ පැවති 12 වන ආසියානු විද්‍යා කවුන්සිල සම්මේලනයට සහ හරිත ආර්ථිකයක් උදෙසා විද්‍යාව බළමුළු ගැන්වීම යන ජාත්‍යන්තර සම්මන්ත්‍රනයට සහභාගී විය

- ගණකාධිකාරිනී කුමාරි පීරිස් මහත්මිය 2012 ජූලි 19 දින නිපුනතා සංවර්ධන අරමුදල විසින් සංවිධානය කරන ලද ඵලදායී අභ්‍යන්තර විගණනය පිළිබඳ වැඩමුළුවට සහභාගී වූවාය.

- විද්‍යා වැඩසටහන් කළමණාකාරිනී ආශා පිටදෙනිය මෙනෙවිය සහ පරිඝණක වැඩසටහන් සහායිකා නිලූකා ලියනාඅරච්චි මහත්මිය 2012 අගෝස්තු 07 වන දින ජාතික කම්කරු ආයතනය විසින් සංවිධානය කරන ලද සිද්ධි කළමනාකරණය පිළිබඳ වැඩමුලුවට සහභාගී වූහ.

- වැඩබලන අධ්‍යක්ෂ ආචාර්ය මුදිත ලියනගෙදර මහතා 2012 සැප්තැම්බර් 10 සිට 27 දක්වා චීනයේ පැවති විද්‍යා හා තාක්ෂණ උපාය මාර්ග සඳහා ජාත්‍යන්තර පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද විද්‍යා, තාක්ෂණ සහ නව්‍යකරණ ප්‍රතිපත්ති – 2012, ජාත්‍යන්තර පුහුණු වැඩසටහනට සහභාගී විය.

- විධායක ලේකම් කුරේ බුලත්සිංහල මහතා 2012 ඔක්තෝබර් 22 දින ජාතික ඩෙංගු නිවාරණ ඒකකය විසින් සංවිධානය කරන ලද ඩෙංගු නිවාරණ වැඩමුළුවට සහභාගී විය.

- වැඩබලන අධ්‍යක්ෂ ආචාර්ය මුදිත ලියනගෙදර මහතා 2012 ඔක්තෝබර් 23 දින ආපදා කළමනාකරණ අමාත්‍යංශය මගින් සංවිධානය කරන ලද ආපදා කළමනාකරණ වැඩමුළුවට සහභාගී විය.

- වැඩබලන අධ්‍යක්ෂ ආචාර්ය මුදිත ලියනගෙදර මහතා 2012 ඔක්තෝබර් 24 දින තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශය මගින් සංවිධානය කරන ලද තීරණ ගැනීමේ ශිල්ප ක්‍රම වැඩමුළුවට සහභාගී විය.

- කළමනාකරණ සහකාරවරියන් වන සයුමි විජේසිංහ මෙනෙවිය සහ නිශාන්ති මහරගේ මෙනෙවිය 2012 ඔක්තෝබර් 31 දින නිපුනතා සංවර්ධන අරමුදල විසින් සංවිධානය කරන ලද කළමනාකරණ සහකාර සංවර්ධන වැඩමුළුවට සහභාගී වූහ

- ගණකාධිකාරිනී කුමාරි පීරිස් මහත්මිය සහ වැඩසටහන් සහායක, ගිණුම් තුසිත රත්නායක මහතා 2012 දෙසැම්බර් 04 සහ 05 යන දිනයන්හි නිපුනතා සංවර්ධන අරමුදල විසින් සංවිධානය කරන ලද, ගිණුම් කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය වාර්තාකරණය වැඩමුළුවට සහභාගී වූහ

# කෘතඥතාවය

## විශේෂඥ සංසද

### ☛ තරුණ විද්‍යාඥ සංසදයේ මෙහෙයුම් කමිටුව

I. චින්තන් මනෝරත්න මහතා
(සභාපති)
පර්යේෂණ නිලධාරී
කාර්මික තාක්ෂණ ආයතනය

II. කෙමින්ද හේරත් මහතා
කථිකාචාර්ය
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

III. එම්. සී. එම්. සකීල් මහතා
කථිකාචාර්ය
රජරට විශ්වවිද්‍යාලය

IV. සුදර්ශන් සෝමසිරි මහතා
ජ්‍යේෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ
කාර්මික තාක්ෂණ ආයතනය

V. ක්‍රිස්ටීන් දසනායක මෙනවිය
විද්‍යා නිලධාරී
ජාතික විද්‍යා පදනම

VII. ගීතානි සමරසිංහ මහත්මිය
පර්යේෂණ නිලධාරී
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ
හා පුහුණු කිරීමේ ආයතනය

VIII. මෙනුකා උඩුගම මෙනවිය
කථිකාචාර්ය
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

IX. ආචාර්ය නිලුක්ෂි ලියනගුනවර්ධන,
පශු පර්යේෂණ නිලධාරී
පශු පර්යේෂණ ආයතනය

X. සිදත් බන්ඩාර මහතා,
පර්යේෂණ නිලධාරී හෙක්ටර් කොබ්බෑකඩුව
ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ
ආයතනය

XI. සී. එන්. නුපේආරච්චි මෙනවිය
බාහිර කථිකාචාර්ය
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

XII. උවසරා දිසානායක මෙනවිය
කථිකාචාරිනී
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

### ☛ සමාලෝචන කමිටු සාමාජිකයන් - කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

I. මහාචාර්ය උපුල් සොන්නාදර (සභාපති)
ජ්‍යේෂ්ඨ මහාචාර්ය
භෞතික විද්‍යා දෙපාර්තමේන්තුව
විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

II. මහාචාර්ය ටී. ආර්. ආරියරත්න
ජ්‍යේෂ්ඨ මහාචාර්ය
භෞතික විද්‍යා දෙපාර්තමේන්තුව
විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

III. ආචාර්ය බී.වී.ආර්. පුන්‍යවර්ධන
ස්වභාවික සම්පත් කලමනාකාරණ
මධ්‍යස්ථානය
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

IV. ඒ. එන්.ආර්. අමරතුංග මයා
අමාත්‍ය ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය

### ☛ සමාලෝචන කමිටු සාමාජිකයන් – නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය

i) මහාචාර්ය එච්.එස්.සී. පෙරේරා
ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය
ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය

ii) ජී.බී. විමලරත්න මයා
හිටපු වැඩ බලන සාමාන්‍ය අධිකාරී
ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

iii) ආචාර්ය එස්.ඒ.කේ. අභයවර්ධන (සභාපති)
හිටපු අධ්‍යක්ෂක
ජාතික විද්‍යා පදනම

iv) ආචාර්ය ගාමිණී විජයරත්න
ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය,
කාර්මික කලමනාකරණ දෙපාර්තමේන්තුව,
විද්‍යා පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය

v) ජී. ප්‍රසාද් ජීරසිංහ මයා
මානව සම්පත් කලමනාකරණය පිළිබඳ
බාහිර කථිකාචාර්ය,
පිරිස් කලමනාකරණ ආයතනය

## ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

### විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

(සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි.)

| | 2012 දෙසැම්බර් 31 | 2011 දෙසැම්බර් 31 |
|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | |
| පුනරාවර්ථන ප්‍රදාන | 15,448,150 | 12,662,000 |
| ප්‍රාග්ධන ප්‍රදාන - විද්‍යා හා තාක්ෂණ සේවා | 709,000 | 876,600 |
| රාජ්‍ය ප්‍රදාන ක්ෂය වීම් හිලව් කිරීම | 5,361,418 | 1,380,957 |
| ආදායම් | 109,936 | 161,623 |
| | **21,628,504** | **15,081,180** |
| **මෙහෙයුම් වියදම්** | | |
| පෞද්ගලික වේතන | 6,796,285 | 6,887,957 |
| ගමන් වියදම් | 435,151 | 218,576 |
| සැපයුම් සහ භාවිතා කළ පාරිභෝජ්‍ය | 274,623 | 251,271 |
| නඩත්තු කිරීම් | 833,478 | 574,130 |
| ගිවිසුම් ගත සේවා | 4,486,096 | 4,125,321 |
| පැවරීම් | 2,614,688 | 1,380,927 |
| විද්‍යා හා තාක්ෂණ සේවා | 810,013 | 1,080,676 |
| ක්ෂය වීම් සහ ණය හිලව් වියදම් | 5,361,418 | 1,380,957 |
| මුළු මෙහෙයුම් වියදම් | **21,611,752** | **15,899,815** |
| කාල පරිච්ඡේදයට අදාල මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද අතිරික්තය/(ඌනතාවය) | 16,752 | (818,635) |
| **මූල්‍ය පිරිවැය** | | |
| දේපළ පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ලැබීම් | (55,450) | 10,570 |
| මෙහෙයුම් නොවන මුළු ආදායම (වියදම්) | - | - |
| අදාල කාලය සඳහා මුළු විස්තීර්ණ (වියදම) / ආදායම | (38,698) | (808,065) |

*ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව*

## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

(සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි.)

| | 2012 දෙසැම්බර් 31 | 2011 දෙසැම්බර් 31 | 2011 ජනවාරි 01 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 13,528,330 | 12,050,084 | 4,267,020 |
| **ජංගම වත්කම්** | | | |
| ඉන්වෙන්ටරි/තොග | 180,769 | 149,907 | 149,484 |
| ලැබිය යුතු වෙළඳ සහ අනෙකුත් දෑ | 14,000 | 12,000 | 12,000 |
| කලින් ගෙවීම් | 1,306,993 | 421,355 | 418,459 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 291,582 | 242,574 | 897,548 |
| සේවක ණය | 570,700 | 619,829 | 471,423 |
| | 2,364,044 | 1,445,665 | 1,948,914 |
| **මුළු වත්කම්** | **15,892,374** | **13,495,749** | **6,215,934** |
| **ස්කන්ධය සහ වගකීම්** | | | |
| **කොටස් හිමියන්ට පවරාදෙන ලද නිකුත්කල ව්‍යාපාර කොටස්වල අගය** | | | |
| සමුච්චිත අරමුදල | 3,793,706 | 5,064,982 | 6,314,193 |
| ප්‍රත්‍යාගණන සචිංත | 1,629,300 | 1,629,300 | 1,629,300 |
| රඳවාගත් ඉපැයුම් | (4,308,804) | (4,270,106) | (3,462,042) |
| **මුළු හිමිකම්** | **1,114,201** | **2,424,176** | **4,481,451** |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විලම්බිත ආදායම් | 12,323,562 | 9,503,753 | 439,500 |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 1,567,679 | 1,399,562 | 1,131,155 |
| | 13,891,241 | 10,903,315 | 1,570,655 |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු වෙළඳ සහ අනෙකුත් දෑ | 886,932 | 168,258 | 163,828 |
| **මුළු වගකීම්** | **14,778,173** | **11,071,573** | **1,734,483** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **15,892,374** | **13,495,749** | **6,215,934** |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / துலைவா / My No: එල්එස්/ඊ/එන්ඒඑස්ටීඊසී/ එෆ්ඒ/2012

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date: 2013 අගෝස්තු 30 දින

සභාපති,
ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව.

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩිදියුණු කිරීමේ පනතේ vii කොටසේ 40(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කොමිෂන් සභාවේ සභාපති වෙත 2013 අප්‍රේල් 01 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම හා වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම.

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka
දුරකථනය
ෆැක්ස් අංකය 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

---

2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

---

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම්

---

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නව ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව (SLFRS & LKAS) පිළියෙල කර ඇති බව දක්වා තිබුණත්, පාරිතෝෂික සහ සේවක ණය සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි.

2

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). ජර්නල් සටහන් වෙනුවෙන් ජර්නල් වවුචර් පිළියෙල කර නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය යුතු ගොඩනැගිලි කුලී රු.180,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු පර්යේෂණ දීමනා රු.11,250 ක් ද, ඒ වෙනුවෙන් ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් රු.900 ක් ද මූල්‍ය ප්‍රකාශනයෙන් අත්හැරී තිබුණි.

2.2.3 නීති, රීති, හා රෙගුලාසි වලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනත | |
| | මුදල් පනතේ 14(1) වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක. පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය | කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසන්වී දින 150 ක් තුළ පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, අවසන් වරට 2010 වර්ෂයේ වාර්ෂික වාර්තාව සභාගත කර තිබුණි. |
| (ඇ) | 2011 පෙබරවාරි 09 දිනැති අංක.13/2008(iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 ඡේදය | දෙපාර්තමේන්තු ප්‍රධානියාට අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණය 140 ක් වුවද, එම සීමාව ලීටර් 405 කින් ඉක්මවා රු.48,810 ක ඉන්ධන දීමනාවක් ද ගෙවා තිබුණි. |

3

(ඇ) මුදල් රෙගුලාසි

| | |
|---|---|
| මු.රෙ. 225 | අවස්ථා 24 කදී එකතුව රු.6,053,290 ක් සඳහා වවුචර් පිළියෙල නොකර ගෙවීම් කර තිබුණි. |
| මු.රෙ. 756 | 2012 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2013 අප්‍රේල් 01 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

2.2.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ආයතනය විසින් වාර්ෂිකව ආණ්ඩුව වෙත ඉදිරිපත් කරනු ලබන "ඉකුත් වර්ෂයේ ශ්‍රී ලංකාව තුළ කරන ලද විද්‍යා තාක්ෂණ කටයුතු සමාලෝචන වාර්තාව" සකස් කිරිම සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලින් තොරතුරු ලබාගැනීම වෙනුවෙන් එකී ආයතන වෙත ගාස්තු නොගෙවා ඒ ඒ නිලධාරීන් වෙත රු.88,000 ක් ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම්වලට අදාළ රජයේ ප්‍රදානය වූ රු.15,448,150 ක් ගණන් ගැනීමෙන් පසු සභාවේ වැඩ කටයුතු වලින් රු.38,698 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් වූ රු.12,662,000 ක රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසු මූල්‍ය ප්‍රතිඵලය රු.808,065 ක ඌනතාවයක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.769,367 ක වර්ධනයක් ඇතිවීම සඳහා පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.2,786,150 ක් රජයේ ප්‍රදාන වැඩිවීම බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

මූල්‍යමය ප්‍රගති වාර්තාවක් පමණක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු අතර, භෞතික කාර්යසාධන වාර්තාවක් 2013 මාර්තු 30 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

4

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

වැඩබැලීමේ තනතුරක් දීර්ඝ කාලයක් සම්පූර්ණ නොකර සිටින අවස්ථාවලදී එම තනතුර තවදුරටත් තබා ගැනීමේ අවශ්‍යතාවය අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් විමසා බැලිය යුතු වුවත්, එසේ නොකර 2010 අගෝස්තු 01 වන දින සිට කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ලෙස වැඩබැලීමේ තනතුරක් වර්ෂ 02 කුත් මාස 04 ක කාලයක් අඛණ්ඩව පවත්වා ගෙන ගොස් තිබුණි.

4.3 ආර්ථික නොවූ ගනුදෙනු

------------------------------

කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී විද්‍යා හා තාක්ෂණ ආයතනයන් 05 ක් සමාලෝචනය (Review) කළයුතු වුවද, රු. 382,795 ක් වැය කර ආයතන 02 ක් පමණක් සමාලෝචනය කර තිබුණි. එම සමාලෝචන වාර්තා පිළිබඳව පසුවිපරමක් නොකරන බැවින් සමාලෝචනය සඳහා දරන ලද වියදම් නිෂ්ඵල වී තිබුණි.

4.4 හඳුනාගත් පාඩු

------------------

ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ සංසදය හා තරුණ විද්‍යාඥයන්ගේ සංසදය සඳහා වැඩමුළු 02 ක් පැවැත්වීමට ආයතනය රු.53,800 ක් වැය කර තිබුණු අතර, ඒ සඳහා සංසදයෙන් එකතු වූ සාමාජික මුදල රු.38,592 ක් වූ බැවින් රු.15,208 ක පාඩුවක් ආයතනයට සිදුවී තිබුණි.

4.5 කාර්යමණ්ඩල පරිපාලනය

-------------------------------

කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩල නිලධාරීන් 18 දෙනෙක්ද, තථ්‍ය කාර්යමණ්ඩල 14 දෙනෙකුගෙන්ද සමන්විත වූ අතර, තථ්‍ය කාර්යමණ්ඩලයේ නිලධාරීන් 04 දෙනෙකු එකී නිලධාරියා සේවයේ නියුක්ත වනතුරු පමණක් එම තනතුර අදාළ වන බැවින් සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 05 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

5.1 අභ්‍යන්තර විගණනය

-------------------------

කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය වෙන් වශයෙන් පිහිටුවා නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් විගණනය කර එක් විගණන විමසුමක් පමණක් නිකුත් කර තිබුණි.

5

5.2 අයවැය පාලනය

--------------------

කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වන විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකම් සඳහා සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.5,052,000 ක් ලෙස අධි අයවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. එම අයවැය නැවත රු.1,752,000 දක්වා සියයට 65 කින් අඩුකර සංශෝධනය කර තිබුණි. නමුත් වර්ෂයේ තථ්‍ය වියදම රු.810,013 ක් වූ අතර, මූල්‍යමය කාර්යසාධනය සියයට 46 ක් වී තිබුණි. ඒ අනුව අයවැය ඇස්තමේන්තුව මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලන.

---------------------

විගණනයේදී නිරීක්ෂණ වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ). නව ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුගතවීම.

(ආ). අයවැය පාලනය.

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති

6

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවට අදාල පිළිතුරු**

ඉහත වාර්තාවට අදාල පැහැදිලි කිරීම් පහත දැක්වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

2.2.1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

(අ) i) 2012 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීමේදී සේවක ණය හා පාරිතෝෂික දීමනාව හැර අනෙක් සියළු ගිණුම් තැබීම් SLFRS සහ LKAS යන නව ගණකාධිකරණ ප්‍රමිත වලට අනුකූලව සිදු කරන ලදී.

ii) සේවක ණය හා පාරිතෝෂික දීමනා ගිණුම් තැබීම එම ප්‍රමිත වලට අනුව කළ නොහැකි වූයේ ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවූ නිසාය. ඊලඟ වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී එම අයිතමයන් දෙකද නව ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව ගිණුම් තබන බව පමණක් සටහනකින් අනාවරණය කිරීම මගහැරී තිබුණි.

***සැ. යු. මෙම විගණන විමසුම 14(2) (සී) කෙටුම්පත් විගණකාධිපති වාර්තාවට පිළිතුරු ඉදිරිපත් කිරීමේදී කොමිසම විසින් ලබාදුන් පැහැදිලි කිරීම් පදනම් කරගෙන සංශෝධනය කර ඇත.***

***වර්තමාන තත්වය***
***2013 වර්ෂයේ ගිණුම් ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙ පිළිබඳව අවධානය යොමුකිරීමට කොමිසම බලාපොරොත්තු වේ.***

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ඉදිරි වර්ෂයේදී ජර්නල් සටහන් වෙනුවෙන් ජර්නල් වවුචර් පිළියෙල කිරීමට බලාපොරොත්තු වේ.

(ආ) මෙය ගිණුම් පිළියෙල කිරීමේදී සිදු වූ මග හැරීමකි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු (2012 දෙසැම්බර් 13 සිට 2012 දෙසැම්බර් 31 දක්වා) පර්යේෂණ සහකාරවරියගේ දීමනාව රු 17,250 ක් නොව රු. 11,250 ක් හා ඒ වෙනුවෙන් ගෙවිය යුතු සේවක අර්ථ සාධක අරමුදල රු. 1,500 ක් නොව රු. 900 ක් ගිණුම් පිළියෙල කිරීමේදී මගහැරී තිබුණි.

***සැ. යු. මෙම විගණන විමසුම 14(2) (සී) කෙටුම්පත් විගණකාධිපති වාර්තාවට පිළිතුරු ඉදිරිපත් කිරීමේදී කොමිසම විසින් ලබාදුන් පැහැදිලි කිරීම් පදනම් කරගෙන සංශෝධනය කර ඇත.***

2.2.3 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම

(අ) 1971 අංක 38 දරන මුදල් පනත

| | |
|---|---|
| මුදල් පනතේ 14(1) වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1. ඡේදය | මින් පෙරද පෙන්වා දුන් පරිදි මෙම ප්‍රමාදයට හේතු වූයේ ආයතනයේ කලක සිට පවතින කාර්ය මණ්ඩල හි- තාවයයි. එම කාර්ය මණ්ඩල හි- තාවය තවදුරටත් නොවිසඳී තිබුණද 2012 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2013.05.10 දින විගණකාධිපති දෙපාර්තමේන්තුවට ලබාදීමට හැකි විය. |
| (ආ) 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3. ඡේදය | ***වර්තමාන තත්වය*** ***2010 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2013.01.30 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර, 2011 වාර්ෂික වාර්තාව 2013.10.22 දින පාර්ලිමේන්තුවට යවා ඇත.*** |

(ඇ) 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008 (iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 ඡේදය

ආයතන අධ්‍යක්ෂකවරයෙකු අයත් වන්නේ අතිරේක ලේකම්වරයකු හෝ ඒ හා සමාන ගණයට මිස දෙපාර්තමේන්තු ප්‍රධානීන් හෝ ඒ හා සමාන නිලධාරීන් ගණයට නොවන බැවින් ඊට අදාල ඉන්ධන දීමනාව ලබාදී ඇත. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2008 ප්‍රකාරව ඉන්ධන දීමනාව ලබා දීමේදී ද කොමිසම ක්‍රියා කර ඇත්තේ මේ පදනමේ සිටය.

(ඈ) මුදල් රෙගුලාසි

මුදල් රෙගුලාසි - අංක 225

2013 ජනවාරි මාසයේ පටන් කොමිසමේ සියළු ගෙවීම් සඳහා චවුචර පත් පිළියෙල කරනු ලබයි.

මුදල් රෙගුලාසි - අංක 756

2012 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිළියෙල කිරීම මේ වන විට අවසන් කර ඇත.

2.2.4 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

නිලධාරීන්ට ගෙවීම් කර ඇත්තේ අදාල සමාලෝචන වාර්තාව සැකසීමට අවශ්‍ය දත්ත හා තොරතුරු ලබා දීම දිරි ගැන්වීම සඳහා වන අතර ඒ සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන ඇත. එම දිරි දීමනාව නිසා අවශ්‍ය දත්ත සහ තොරතුරු ලබාගැනීම පහසු හා කාර්යක්ෂම විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

කොමිසම වර්ෂයේ තෙවන කාර්තුව තෙක් වන භෞතික කාර්ය සාධන වාර්තාව පිළියෙල කර ඇත. එහෙත් අවසාන කාර්තුවේ ඇති වූ කාර්යබහුලත්වය සහ පැවති කාර්ය මණ්ඩලය තව දුරටත් අඩු වීම නිසා මුළු වර්ෂයම සඳහා වන එම වාර්තාව පිළියෙල කිරීම ප්‍රමාද වී ඇත.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

එම තනතුර කොමිසමේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී තනතුර බැවින් එය තබා ගැනීම අත්‍යවශ්‍ය වේ. මේ වන විට නව කොමිසන් සභාවක් පත් කර ඇති හෙයින් එම තනතුර සඳහා පුවත්පත් දැන්වීමක් පල කර අධ්‍යක්ෂකවරයෙකු බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

4.3 ආර්ථික නොවූ ගනුදෙනු

1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ 5 (ඈ) වන වගන්තිය අනුව අප වෙත බලය පැවරී ඇත්තේ " විද්‍යා හා තාක්ෂණ ආයතන වල ප්‍රගතිය සමාලෝචනය කිරීම" සඳහා පමණි. මෙම සමාලෝචන මගින් සොයා ගන්නා කරුණු වාර්තාවක් මගින් අප අදාල ආයතනයට භාර දෙන අතර එම වාර්තාවෙම පිටපතක් තාක්ෂණ පර්යේෂණ හා පරමාණුක ශක්ති අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබේ. මෙම වාර්තා වල අඩංගු නිර්දේශ ක්‍රියාත්මක කිරීම එම අදාල ආයතන වල වගකීම වේ. ඔවුන් එම නිර්දේශ ක්‍රියාත්මක කරන්නේද නැද්ද යන්න සොයා බැලීම සඳහා අප ආයතනය වෙත බලය පැවරී නැත.

4.4 හඳුනාගත් පාඩු

කොමිසම ලාභ අරමුණු කර ක්‍රියාත්මක වන ආයතනයක් නොවේ. එබැවින්, ආයතනයට පාඩුවක් සිදු වී නොමැත. වැඩමුළු සඳහා සහභාගී වන සංසද සාමාජිකයන්ගෙන් යම් සහභාගී වීමේ ගාස්තුවක් අයකරනුයේ වැඩමුළු වලින් ලැබෙන ප්‍රයෝජන නිසා සහභාගී වන සාමාජිකයින් පමණක් තෝරා ගැනීමේ සහ එමගින් වැඩමුළු සඳහා වැයවන මුදල් අඩු කර ගැනීමේ උපක්‍රමයක් ලෙසය.

4.5 කාර්යමණ්ඩල පරිපාලනය

තත්‍ය කාර්ය මණ්ඩලයේ තනතුරට පමණක් සීමා වූ නිලධාරීන් නොමැති අතර, තනතුරු 5 ක පමණක් පුරප්පාඩු පවතී. අධ්‍යක්ෂක තනතුරේ පුරප්පාඩුව පිරවීම සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීමට මේ වන විට කටයුතු සිදු කරමින් පවතී. සන්නිවේදන තාක්ෂණ/දත්ත ගබඩා සහකාර තනතුර හා කළමනාකරණ සහකාර තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත. ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ තනතුරු දෙකේ බඳවා ගැනීමේ පරිපාටිසංශෝධනය කර ඒ සඳහා අවසර ලබා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව එය වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමේ අදහස් ලබාගැනීම සඳහා යොමු කර ඇත. කොමිසමේ ප්‍රධාන සහ අත්‍යවශ්‍ය තනතුරු තුනක පුරප්පාඩු පිරවීම සඳහා අවසර ලබා දීම මේ දක්වා ප්‍රමාද වීම කොමිසමේ කාර්ය සාධනයට ඉතා තදින් බලපා ඇත.

*සැ. යු. මෙම විගණන විමසුම 14(2) (සී) කෙටුම්පත් විගණකාධිපති වාර්තාවට පිළිතුරු ඉදිරිපත් කිරීමේදී කොමිසම විසින් ලබාදුන් පැහැදිලි කිරීම් පදනම් කරගෙන සංශෝධනය කර ඇත.*

***<u>වර්තමාන තත්වය</u>***
***සන්නිවේදන තාක්ෂණ/දත්ත ගබඩා සහකාර තනතුරේ පුරප්පාඩුවට මේ වන විට නිලධාරිනියක් බඳවාගෙන ඇති අතර, කළමනාකරණ සහකාර තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා මේ වන විට සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත.***

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

මේ සම්බන්ධව අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකවරයා දැනුවත් කර ඇත.

### 5.2 අයවැය පාලනය

කොමිසමේ විද්‍යාත්මක කාර්ය මණ්ඩලයේ ඌනතාවය හා නව කොමිෂන් සභාවක් පත් කර නොතිබීම යන කරුණු නිසා 2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතැම් කාර්යන් (උදා:- BICOST) සැලසුම් කල පරිදි සිදු කිරීමට නොහැකි වූ බැවින් ආයතනයට වෙන් කරන ලද මුදල් කාර්යක්ෂමව යොදා ගැනීම සඳහා 2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් ක්‍රියාකාරී සැලැස්මේ ඇතැම් කාර්යයන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් 65% ක පමණ ප්‍රමාණයක් ඉහත තත්වය යටතේ සිදු කල හැකි වෙනත් කර්යයන් සඳහා මාරු කරන ලදී.

2012 ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ක්‍රියාකාරකම් සිදු කිරීමේදී පැන නැගුණු ගැටළු ඒ ඒ ක්‍රියාකාරකම් යටතේ පහත දක්වා ඇත. මෙම ගැටළු නිසා කොමිසමේ මූල්‍යමය කාර්ය සාධනය 46% කට සීමා වී තිබුණි.

| | |
|---|---|
| **1) ද්වි වාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව** | මෙම සමුළුව පැවැත්වීමට නොහැකි වූයේ ඒ සඳහා අවශ්‍ය මග පෙන්වීම හා උපදෙස් ලබා ගැනීම සඳහා කොමිෂන් සභාවක් නොමැති වීම නිසාය. |
| **2) විද්‍යා හා තාක්ෂණ ආයතන සමාලෝචනය** | 2012 වර්ෂය සඳහා සමාලෝචනය කිරීමට නියමිතව තිබූ ආයතන හතර ඒ සඳහා ලබා දිය යුතු ස්වයං ඇගයීම් වාර්තා කොමිසමට ලබා දීමේදී සිදු වූ ප්‍රමාදයන් නිසා නියමිත කලට එම ආයතන සමාලෝචනය කිරීමට නොහැකි විය. එම නිසා එම ආයතන 4න් සමාලෝචනය කිරීමට හැකිවූයේ එක් ආයතනයක් පමණි එහෙත් කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කළ විශේෂ ඉල්ලීමකට අනුව එම දෙපාර්තමේන්තුව 2012 මැයි 10 හා 11 යන දිනයන්හිදී සමාලෝචනය කරන ලදී. අවසාන විගණිත දිනය වන විටත් එක් සමාලෝචනයක් සඳහා අවසාන ගෙවීම සිදු කර නොතිබුණේ අවසාන සමාලෝචන වාර්තාව කොමිසම වෙත ලැබී නොතිබූ බැවිනි. |
| **3) ජාතික විද්‍යා හා තාක්ෂණ සමාලෝචනය** | මෙම සමාලෝචනය සඳහා විද්‍යා හා තාක්ෂණ ආයතන වලින් අවශ්‍ය දත්ත සහ තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලියක් 2012 පෙබරවාරි 3 වැනි දින එම ආයතන වෙත යවන ලදී. පිළිතුරු ලබා දීම සඳහා දෙන ලද අවසන් දිනය 2012 මාර්තු 15 වුවද, ඇතැම් ආයතන වලින් පිළිතුරු ලබාදීමේදී සිදු වූ ප්‍රමාදයන් නිසා සහ ඇතැම් තොරතුරු/දත්ත වල නිරවද්‍යතාවය යළි තහවුරු කරගැනීමට සිදු වූ නිසා තොරතුරු/දත්ත එක් රැස්කිරීමේ කාර්යය අවසන් වූයේ 2012 අගෝස්තු මාසයේදීය. මේ හේතුවෙන් එම වාර්තාව සැකසීම ප්‍රමාද විය. 2012 සැප්තැම්බර් වන විට අතුරු සමාලෝචන වාර්තාවක් සකස් කර අවසන් කෙරිණි. එහි අවසන් වාර්තාව මේ වන විට සංස්කරණය කෙරෙමින් පවතී. |

| | |
|---|---|
| 4) **විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති සැකසීමේ අධ්‍යයන කණ්ඩායම්** | මෙම ක්‍රියාකාරකම සිදු කිරීම සඳහා ප්‍රමාණවත් විද්‍යාත්මක කාර්යය මණ්ඩලයක් කොමිසම සතුව නොමැති වීම නිසා එම කාර්යය කල් දැමීමට සිදු විය. (අවශ්‍ය විද්‍යාත්මක කාර්යය මණ්ඩලය බඳවා ගැනීම සඳහා 08/07/2012 දින අයදුම්පත් කැඳවුවද අවශ්‍ය සුදුසුකම් සපුරා තිබූ කිසිදු අයදුම්කරුවෙකු නොසිටි බැවින් එම පුරප්පාඩු පිරවීමට නොහැකි විය. තවද මෙම තනතුර සඳහා ඉල්ලා සිටින සුදුසුකම් සංශෝධනය කිරීම සඳහා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ මේ වන විට කටයුතු කෙරෙමින් පවතී). |
| 5) **ජාත්‍යන්තර විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකම්** | BIMSTEC රටවල තාක්ෂණ හුවමාරුව සඳහා පිහිටුවන ලද තාක්ෂණ පැවරුම් පහසුකමේ කටයුතු සඳහා මෙලෙස මුදල් වෙන් කලද ඒ සඳහා මූලිකත්වය ගෙන ක්‍රියාකරන විදේශ කටයුතු අමාත්‍යාංශය එහි කටයුතු සඳහා 2012 වසර තුළදී කොමිසමේ දායකත්වයක් ඉල්ලා නොසිටි බැවින් ඒ සඳහා වෙන් කළ මුදල් වියදම් නොවිණ. |
| 6) **ඒකාබද්ධ ආයතනික ක්‍රියාකාරී සැලැස්මේ කටයුතු** | මෙම ක්‍රියාකාරකමට අදාළ කටයුතු කල් දැමීමට සිදු වුයේද කොමිසමේ විද්‍යාත්මක කාර්යය මණ්ඩල හි- තාවයයි. |

***සැ. යු.*** ***මූල් විගණන විමසුමට එකතු කරන ලද, අයවැය ඇස්තමේන්තුව මූල්‍ය කළමණාකරන පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැත යන ප්‍රකාශයට අදාළ පිළිතුරු පහත දක්වා ඇත.***

***අපගේ පාලනයෙන් පරිබාහිර ඉහත ගැටළු නිසා අයවැය ඇස්තමේන්තුව මූල්‍ය කළමණාකරන පාලන කාරකයක් ලෙස උපයෝගී කරගැනීම අපහසු විය.***

***<u>වර්තමාන තත්වය</u>***
***2013.04.22 දින අතිගරු ජනාධිපතිතුමා විසින් නව සභාපතිවරයෙක් සහ කොමිෂන් සභා සාමාජිකයින් පත්කල අතර, මේ වන විට ද්වි වාර්ෂික සමුළුව ඇතුළු අනෙකුත් විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකම් වලට අදාල තීරණ ගෙන ක්‍රියාත්මක කරමින් පවතී.***

## 6 පද්ධති හා පාලන

මෙම පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධව විශේෂ අවධානය යොමු කිරීමට කොමිසම කටයුතු කරනු ඇත.